# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2364/11 – 2023 දෙසැම්බර් මස 27 වැනි බදාදා – 2023.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/220.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.06.09 දිනැති හා අංක 2335/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, හිරිපිටිය, අංක 58/33 ලිපිනයෙහි පදිංචි ඒ. ඒ. අමරතුංග මයා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 34 ලිපිනයෙහි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/43/2023 හා 2023.11.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 041118 – 11 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය: A/43/2023.
ගොනු අංකය: IR/COM/04/2020/220.

ඒ. ඒ. අමරතුංග මයා,
අංක 58/33,
හිරිපිටිය,
පන්නිපිටිය.

*පළමු පාර්ශ්වය*

එරෙහිව

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමතයට පත්කිරීම සඳහා 2023 ජූනි 01 වැනි දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් නීතිඥ ඩබ්ලිව්. ඒ. ජයවික්‍රම වන මා පත්කොට මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අංක IR/COM/04/2020/220 හා 2023.05.10 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත්තේ “මෙම කාර්මික ආරාවුලට හේතුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ ඒ. ඒ. අමරතුංග මහතාට එම අධිකාරියේ සේවය කළ කාලය තුළ උසස්වීම් ලබාදීමේ දී අසාධාරණයක් සිදුකොට ඇත්ද යන්නත් එසේ අසාධාරණයක් සිදුකර තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද” යන්නත් පිළිබඳව බේරුම්කරණ ක්‍රියාවලිය තුළින් විසඳුමක් ලබාදෙන ලෙසයි.

ඒ අනුව මෙම කාර්මික ආරාවුලට අදාළ දෙපාර්ශ්වය 2023.07.11 දින කම්කරු දෙපාර්තමේන්තුවට කැඳවීම්. අනතුරුව 2023.08.10, 2023.09.26, 2023.10.16 වශයෙන් දින 3ක් මෙම පාර්ශ්වයන් කැඳවූ අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් දෙවන පාර්ශ්වයේ නීතිඥවරයාට අමතරව නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරයෙකු ද නියෝජනය කරන ලදී.

පළමුවන පාර්ශ්වයේ ප්‍රධාන ඉල්ලීම වනුයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රාථමික ශ්‍රේණියේ රැකියාවක් සඳහා බඳවාගත් ඒ. ඒ. අමරතුංග මහතාට ඔහුගේ සමකාලීනයන් දෙදෙනෙකුට ලබාදුන් උසස්වීම්වලට අනුරූපව තමන්ට උසස්වීම් ලබා නොදුන් බවත් තමන් රාජ්‍ය සේවය යහපත්ව හා කාර්යක්ෂමව කළ බවට ඇගයීම් පවා ලබා තිබුණ ද උසස්වීම් වෙනුවෙන් වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කළ ද තමාට උසස්වීම් ලබා නොදුන් බවයි. 1982.04.06 වන දින සේවයට බැඳුණු තමන් මුලින් අනියම් සේවය ද අනතුරුව

1988.09.01 සිට ස්ථිර සේවකයෙකු වශයෙන් ද කටයුතු කළ අතර 2019.01.16 වැනි දින සේවයෙන් විශ්‍රාම යන තෙක්ම 2005.10.12 දින ලබාදුන් කාර්යාල සේවක සේවයේ VIII වන ශ්‍රේණියේ ප්‍රාථමික ගණයේ (PL) සේවයක නිරත වූවා මිස තමාගේ සමකාලීනයන්ට මෙන් අභ්‍යන්තර උසස්වීම් යටතේ VII වන ශ්‍රේණියට උසස්වීම් ලබාදී අනතුරුව කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1-2 තනතුරක් ලබානොදුන් බවත් ප්‍රකාශ කර සිටී. පළමුවන පාර්ශ්වකරුගේ ලිඛිත හා වාචික ඉල්ලීම් සම්බන්ධව දෙවන පාර්ශ්වයේ ලිඛිතව හා වාචිකව කරුණු ඉදිරිපත් කරමින් කියා සිටින්නේ, පළමුවන පාර්ශ්වකරුට අවස්ථා තුනකදී නිසි පරිදි උසස්වීම් ලබා දී ඇති බවත් තවත් අවස්ථා දෙකකදී උසස්වීම් සඳහා අයදුම් කළ ද අවශ්‍ය වන පළපුරුද්දට අදාළ සේවා කාලය සම්පූර්ණ කර නොතිබූ බැවින් එම අවස්ථා දෙක අහිමි වූ බවයි. පළමුවන පාර්ශවකරු ගෙන හැර දක්වන සමකාලීනයින්ට හා පළමුවන පාර්ශ්වකරුට අභ්‍යන්තර උසස්වීම් ලබාදීමේ දී ගත වූ කාලය ගණනය කළෙමි. ඒ අනුව කාර්යාල සේවක සේවයේ XI සිට X ශ්‍රේණි දක්වා උසස්වීම් සඳහා සමකාලීනයින්ට අවුරුදු 2ක් ගත වූ අතර අමරතුංග මහතාට අවුරුදු 3ක් ගත වී ඇති X සිට IX ශ්‍රේණිය දක්වා උසස්වීමට සමකාලීනයින්ට අවුරුදු 4-6ක් ගත වුව ද අමරතුංග මහතාට අවුරුදු 7ක් ගත වී ඇත. IX සිට VIII වන ශ්‍රේණිය සඳහා සමකාලීනයින්ට අවුරුදු 11ක් ගත වුවද අමරතුංග මහතාට ගතවී ඇත්තේ අවුරුදු 7කි. සමකාලීනයින්ට VIII වන ශ්‍රේණියේ සිට VII වන ශ්‍රේණියට උසස්වීමට අවුරුදු 11ක් ගතවී ඇත. ඒ. ඒ. අමරතුංග මහතාට VII වන ශ්‍රේණියට උසස්වීම ලැබී නැත. ඒ අනුව ඉතා පැහැදිලි වන්නේ පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතාට වඩා විශේෂ සැලකිල්ලක් හෝ වරප්‍රසාදයක් යටතේ ඔහුගේ සමකාලීනයින්ට උසස්වීම් ලබා දී නොමැති බවයි. පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතාගේ සමකාලීනයින්ට උසස්වීම් ලබාදුන් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 7613 අදාළ වන්නේ නිශ්චිත කරුණකට පමණි. එය පසුකාලීන උසස්වීමට අදාළ නොවේ.

නමුත් 2005.10.12 වැනි දින පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා කාර්යාල සේවක සේවයේ, VIII ට උසස්වීම ලබා දී ඇති අතර 2019.01.16 වැනි දින ඔහු විශ්‍රාම යන තෙක්ම එම ශ්‍රේණියේ සේවය කර ඇත. ඔහුට සමකාලීනයන්ට මෙන් වසර 11ක් සේවා කාලයෙන් පසු VII වන ශ්‍රේණිය ලැබී නොමැත. ඊට හේතු ලෙස දෙවන පාර්ශ්වය සඳහන් කරන්නේ සේවක සංඛ්‍යා අනුමත කර ගැනීම හා බඳවාගැනීමේ පටිපාටිය මහ භාණ්ඩාගාරය වෙතින් අනුමත කර ගැනීමට නොහැකි වීම මේ සඳහා බලපා ඇති බවයි.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ප්‍රිමියුලා ගුණසේකර මෙනෙවිය 2023.10.16 වැනි දින බේරුම්කරණ විභාගයේ දී ඉදිරිපත් කළ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් කළමනාකරණ හා පාලන) ගේ අංක 3/2/3/7/2/304 හා 2023.06.21 දිනැති (දිනය අපැහැදිලිය) ලිපිනයේ අංක 1 යටතේ පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා කාර්යාල සේවක සේවයේ VIII ශ්‍රේණියේ සේවය කළ කාලය 2005.10.12 සිට 2013.12.31 දින දක්වා පමණක් බව පැහැදිලිව සඳහන් කර ඇත. නමුත් 2014.01.01 සිට 2019.01.16 දින ඔහු විශ්‍රාම ගන්නා තෙක් ඔහුට අදාළ කාර්යාල සේවක සේවයේ ශ්‍රේණිය සඳහන් කර නොමැත. එසේම මෙම බේරුම්කරණය සඳහා දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ප්‍රිමියුලා ගුණසේකර ගොනු කළ 2023.10.31 දිනැති ලිඛිත දේශනයේ 2 වන පිටුවේ “සටහන” තුළින් ද ඉතා පැහැදිලිව සඳහන් කර ඇත්තේ පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා 2005.10.12 සිට 2013.12.31 දින දක්වා දේශපාලන පළිගැනීම් කමිටු නිර්දේශය මත කාර්යාල සේවක සේවයේ VIII වන ශ්‍රේණියට උසස් කර සේවය කළ බවයි. එම ලිඛිත දේශනයේ ද 2014.01.01 සිට ඔහු විශ්‍රාම ගන්නා 2019.01.16 දින දක්වා කාලය පිළිබඳ කිසිදු සඳහනක් නොමැත. ඒ අනුව දෙවන පාර්ශ්වකාර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වගකිවයුතු නිලධාරීන් දෙදෙනෙකු ඉතා පැහැදිලිව ලිඛිතව දන්වා සිටින්නේ පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා 2005.10.12 වැනි දින සිට 2013.12.31 දින දක්වා පමණක් කාර්යාල සේවක සේවයේ VIII වන ශ්‍රේණියේ අයෙකු වශයෙන් සේවය කළ බවයි. එයින් ඉතා පැහැදිලි වන්නේ 2014.01.01 සිට 2019.01.16 වැනි දින ඒ. ඒ. අමරතුංග විශ්‍රාම ගන්වන තුරු ඔහු කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණියෙ අයෙකු බව දෙවන පාර්ශ්වය ව්‍යාංගයෙන් පිළිගන්නා බවයි. ඒ අනුව 2014.01.01 දින සිට පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණියට උසස් කළ යුතු බව තීරණය කරමි. 2014 වන විට කාර්යාල සේවක සේවයෙ ශ්‍රේණිය PL ගණයේ ශ්‍රේණියක් වශයෙන් ප්‍රතිව්‍යුහගතකර ඇති බැවින් ඊට ගැලපෙන සේ එම ශ්‍රේණිය සකස් කළ යුතු වේ. කෙසේ වෙතත් පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා කාර්යාල සේවක සේවයේ VII ශ්‍රේණියට උසස් කිරීමෙන් අනතුරුව තම සමකාලීනයින්ට මෙන් කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) MA 1-2 තනතුරකට උසස් කරන ලෙසට වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි. ඒ අනුව මෙම බේරුම්කරණ ක්‍රියාවලිය අවසානයේ කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා විසින් සිය යොමුවෙන් මා වෙත ලබා දී ඇති ප්‍රශ්නවලට පහත පරිදි පිළිතුරු සපයමි.

ප්‍රශ්නය 01 : ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ ඒ. ඒ. අමරතුංග මහතාට එම අධිකාරියේ සේවය කළ කාලය තුළ උසස්වීම් ලබාදීමේ දී අසාධාරණයක් සිදුකොට ඇත් ද ?

පිළිතුර : පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතාට කාර්යාල සේවක සේවයේ ශ්‍රේණියේ VIII ශ්‍රේණිය තෙක් උසස්වීම් ලබාදීම පිළිබඳ සෑහීමකට පත් වෙමි. නමුත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් කළමනාකරණ හා පාලන) ගේ අංක 3/2/3/7/2/304 හා 2023.06.21 දිනැති (දිනය අපැහැදිලිය) ලිපිය මගින් හා එම අධිකාරියේ නීතිඥවරිය විසින් මෙම බේරුම්කරණයට ගොනු කළ 2023.10.31 දිනැති ලිඛිත ප්‍රකාශයෙන් ද පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතාට කාර්යාල සේවක සේවයේ VIII ශ්‍රේණිය ලබා දී ඇත්තේ 2005.10.12 වැනි දින සිට 2013.12.31 දින දක්වා පමණක් බව ඉතා පැහැදිලිව දක්වා ඇති නිසාත් 2014.01.01 දින සිට ඔහුගේ සේවය කුමන ශ්‍රේණියට අයත් ද යන්න දක්වා නොමැති නිසාත් උසස්වීම් ශ්‍රේණිගත කිරීම අනුව VIII වන ශ්‍රේණියට පසුව උසස් කළ යුත්තේ VII වන ශ්‍රේණියට බැවින් 2014.01.01 දින සිට ඒ. ඒ. අමරතුංග මහතාට කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණිය ලබා නොදීම අසාධාරණයක් බව පිළිගනිමි.

ප්‍රශ්නය 02 : එසේ අසාධාරණයක් සිදුකර තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනය කවරේ ද?

පිළිතුර : ඉහත දක්වූ ආකාරයට ඒ. ඒ. අමරතුංග මහතා 2014.01.01 සිට කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණියට උසස් කළ යුතුය. (ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු PL ශ්‍රේණියට) ඒ අනුව 2014.01.01 දින ඔහු විශ්‍රාම ගන්වන 2019.01.16 වූ කාලය සඳහා ඒ. ඒ. අමරතුංග මහතාට කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණියට අදාළ වැටුප් හා දීමනා හිමිවිය යුතු වේ. එම හිඟ වැටුප් හා දීමනා ගණනය කළ යුත්තේ ඔහුට එම කාලය තුළ ගෙවූ වැටුප් හා දීමනා ගැලපීමෙන් පසුවය. එමෙන්ම පළමුවන පාර්ශ්වකරුට 2014 සිට 2018 වර්ෂය දක්වා වාර්ෂික වැටුප් වර්ධක ගෙවා ඇත්නම් එය ද නිසි පරිදි ගැලපිය යුතු වේ.

පළමුවන පාර්ශ්වකරු කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණියට උසස්වීමේ දී ලැබිය යුතු මූල්‍යමය සහනය පිළිබඳ පළමුවන පාර්ශ්වකරු ලිඛිතව කිසිවක් සඳහන් කර නොමැත. විශේෂයෙන් මෙම බේරුම්කරණ ප්‍රදානය ලබාදෙන අවස්ථාව වන විට ඒ. ඒ. අමරතුංග මහතා විශ්‍රාම ගොස් වසර 4කට වැඩි කාලයක් ගත වී ඇති නිසාත් ඔහු සේවය කළ ප්‍රාථමික ගණයේ රැකියාව සැලකූ විට ඔහුට හිමිවිය යුතු වැටුප් තලය පිළිබඳ ගණනය කර ගැනීමේ අපහසුතාවය පිළිගනිමි.

2014.01.01 දින සිට පළමුවන පාර්ශ්වකාර ඒ. ඒ. අමරතුංග මහතා කාර්යාල සේවක සේවයේ VII වන ශ්‍රේණියට උසස්කළ යුතු බව තීරණය කරමි.

පළමුවන පාර්ශ්වකරුට උසස්වීම හිමිවිය යුතු 2014.01.01 දිනයට අදාළ වැටුප හා වෙනත් දීමනා සම්බන්ධ මූල්‍යමය වශයෙන් ගණනය කිරීම දෙවන පාර්ශ්වකරුගේ වගකීමක් බව සඳහන් කරමි. එම මූල්‍යමය වටිනාකම මෙම ප්‍රදානය ගැසට්ගත කිරීමෙන් මසක් ඇතුළත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය. මෙම තීරණය හේතුකොටගෙන පළමුවන පාර්ශ්වකරුට ලබාගැනීමට හිමිකම් ඇති වෙනත් ව්‍යවස්ථාපිත දීමනා හෝ අයවීමක් වේ නම් ඒ සඳහා මෙම තීරණය බාධාවක් නොවන බව සඳහන් කරමි.

ඉහත තීරණය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බව ප්‍රකාශ කරමි.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2023 නොවැම්බර් මස 15 වැනි දින දී ය.

EOG 12 - 0371

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.